## 1.17 මහනුවර යුගයේ ප්‍රාථමික අධ්‍යාපන පාඨ්‍ය ග්‍රන්ථවලින් හෙළිවන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

පූජ්‍ය ගල්කිරියාගම විමලානන්ද හිමි
නාගරුක්ඛාරාම පුරාණ විහාරය, වේවැල්දූව, කැලණිය.

## ABSTRACT

1 මහින්දාගමනයෙන් පසුව ආරම්භ වූ ලංකාවේ විධිමත් අධ්‍යාපන පද්ධතිය මගින් ඉතා ක්‍රමානුකූල විවිධ විෂය මාලාවක් අනුගමනය කරමින් දහස් ගණනක් ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබාදෙන ලදී. ආධ්‍යාත්මික මෙන්ම බාහිර ශික්ෂණය සහිත වූ එම අධ්‍යාපන ක්‍රමවේදය වරින්වර පැන නැගුණු අභ්‍යන්තර හා විදේශීය ආක්‍රමණ හේතුවෙන් රාජධානි වෙනස්වෙමින් මෙන්ම කාලීන හා සමාජීය අවශ්‍යතා අනුව නොයෙක් වෙනස්කම්වලට ලක්වෙමින්, ආරම්භයේ පටන්ම පැවති අධ්‍යාපන අරමුණු එලෙසින්ම ක්‍රියාත්මක වෙමින් 16 සියවසේදී පෘතුගීසි ආක්‍රමණ එල්ලවීම දක්වාම මෙහි පැවතිණ. බටහිර ආක්‍රමණ එල්ලවීමෙන් අනතුරුව මෙහි පැවති දේශීය අධ්‍යාපනය නවීකරණයට ලක් කරන ලදී. බටහිර ආක්‍රමණ එල්ලවූ මුල් කාලයේ එම ජාතිකයින්ට යටත් වූ ප්‍රදේශවල හා පසුව ඉංග්‍රීසීන් විසින් (මුළු රටම යටත් කරගැනීමෙන් අනතුරුව) ලංකාව පුරාම ඔවුනගේ අධ්‍යාපන රටාව ස්ථාපිත කිරීමට කටයුතු යොදන ලදී. නමුත් මෙකල පවා ලංකාවේ ඉපැරණි දේශීය අධ්‍යාපන ක්‍රමය රට තුළ සුරැකිව පැවතිණ. මෙහිලා මහනුවර යුගය විශේෂ වේ.

2 මහනුවර යුගයේ මෙරට දේශීය අධ්‍යාපනය ක්‍රියාත්මක වූ **පන්සල් හා ගැමි පාසල** පිළිබඳ විශේෂයෙන් විමසිය යුතුය. එහි ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපනයේදී භාවිත කරන ලද **හෝඩිය, නම් පොත, මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කව්පොත, බුද්ධ ගද්‍යය හා සකස්කඩ** යන කෘති හා ඒවාට ආදේශක කෘතිවන **දහම් සොඬ හැල්ල, දහම්හිනික්මන් වර්ණනාව, වීතරාගේන්ද්‍ර කාව්‍යය** යනාදිය නූතන අධ්‍යාපන රටාව තුළ සම්භාවනාවට පාත්‍ර වූ කෘති වේ.

3 ප්‍රාථමික අධ්‍යාපන ග්‍රන්ථ තුළින් හෙළිවන පහත දක්වෙන කරුණු කෙරෙහි අප අවධානය යොමු කළ යුතුය.

3.1 පරමාර්ථ හා අරමුණු

3.2 අධ්‍යාපන ක්‍රමවේදය
i අතපොත් තැබීම
ii අධ්‍යාපනික රටාව - ප්‍රාථමික අධ්‍යාපනය

3.3 අධ්‍යයන ක්‍රම

| | | | |
|---|---|---|---|
| i. | වනපොත් කිරීම | vi. | ස්මෘතිය |
| ii. | පිල්ලම් කීම | vii. | නිරන්තර ගුරු උපදෙස් ලැබීම |
| iii. | කියවීම | viii. | ස්වයං අධ්‍යාපනය |
| iv. | ලිවීම | ix. | සාකච්ඡා |
| v. | සවන්දීම ` | x. | සතතාභ්‍යාසය |

3.4 අධ්‍යාපන මූලධර්ම
i. උපනිෂද් ක්‍රමය
ii. බෞද්ධ අධ්‍යාපනයක් ලබාදීම
iii. කාව්‍ය මගින් විවිධ විෂය ඉගැන්වීම
iv. පළමුව ශබ්ද හා දෙවනුව අක්ෂර මගින් භාෂා සාධනය ලබාදීම
v. අක්ෂර (භාෂාව) ඉගැන්වීමේදී කාව්‍ය සම්ප්‍රදාය යොදා ගැනීම
vi. පොතින් පොත සමත් වීම

vii. වෘත්තීය අධ්‍යාපනය
viii. ගුරු හා විෂයකේන්ද්‍රීය අධ්‍යාපනය

3.5 විවිධ ඉගැන්විම් ක්‍රම

සාකච්ඡා, පෞද්ගලික, ප්‍රායෝගික, පරිවර්තන, සජ්ඣායනා, ප්‍රශ්නකරණය, දේශන හා සමූහ යන ඉගැන්වීම් ක්‍රම භාවිතය

3.6 විෂය මාලාව

සෞඛ්‍යය, ගණිතය, පරිසර අධ්‍යාපනය, ආගමික, ශාස්ත්‍රීය, හා ශිල්පීය යන විවිධ විෂය මාලාවක් භාවිත කිරීම.

3.7 පෙළඹවීමේ ක්‍රම.

දෙවියන් යැදීම, ගී විරිත් භාවිතය, දේව පූජා, සුභ නැකැත් යොදාගැනීම, ගුරු පඩුරු, දඬුවම් යොදාගැනීම.

3.8 ඉගෙනුම් ආධාරක යටතේ, වැලි හා වැලි පිල, වැලිපත, පන්හිද, තල්පත හා පුස්කොළ භාවිත කිරීම.

3.9 ශිෂ්‍ය ප්‍රතිපත්ති, වතාවත් හා විනය.

3.10 ශිෂ්‍ය විශ්වාස හා ඇදහිලි, පුදපූජා ක්‍රම, ගුරු පූජා ආදිය.

3.11 **සැමට අධ්‍යාපන සංකල්පය.**